ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
නිවාඩු කාලීන පාසල් වැඩසටහන - 2020

4 ශ්‍රේණිය -මව්බස - නිවාඩු පාසල
බ/බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයීය
ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් ප්‍රාථමික අංශය.

# 4 ශ්‍රේණිය - ඒකවචන හා බහුවචන නාම පද

★ ඒකවචන නාම පද :- එක් දෙයක් පිළිබඳ ව හැඳින්වීමට අප භාවිතා කරන නාම පද ඒකවචන නාම පද වේ.

උදා :- පොත , පුටුව , පැන

★ බහුවචන නාම පද :- එකකට වඩා වැඩි යමක් පිළිබඳ ව හැඳින්වීමට අප භාවිතා කරන නාම පද බහුවචන නාම පද වේ.

උදා :- පොත් , පුටු , පෑන්

(01). පළමුවන , දෙවන හා තුන්වන ශ්‍රේණිවල අප ඉගෙන ගත් ඒකවචන හා බහු වචන මතකයෙන් ලියන්න.

1. ගස - ................................................
2. මල - ................................................
3. ගල - ................................................
4. අම්මා - ................................................
5. තාත්තා - ................................................
6. කුරුල්ලා - ................................................
7. උදැල්ල - ................................................
8. ගොවියා - ................................................
9. බල්ලා - ................................................
10. ගවයා - ................................................
11. පොත - ................................................
12. කුඹුර - ................................................
13. ළමයා - ................................................

**14. ශිෂ්‍යයා - ..................................................**

**15. මම - ..................................................**

**(02). පහත ඡේදයේ ඉරි ඇඳි පද නිවැරදි ව ඒකවචන නාම පද හා බහුවචන නාම පද ලෙස වෙන් කරන්න.**

ඉද්දමල්ගොඩ විද්‍යාලයයේ සෑම වසරක ම පැවැත්වෙන ප්‍රදර්ශනය මෙවර ද උත්කර්ෂවත් අයුරින් එම විද්‍යාලයේ දී පැවැත්විණි. අප විද්‍යාලයයේ හතර වන සහ පස් වන ශ්‍රේණිවල සිසුහු ද එම ප්‍රදර්ශනය නැරඹීමට ගියහ.

ප්‍රදර්ශනය ආරම්භ වන තුරු අපි පිට්ටනියට ගොස් පේළියට සිට ගතිමු. වෙනත් පාසල්වලින් පැමිණි සිසුන් ද පිට්ටනියේ පේළි සෑදී සිටිනු අපි දුටුවෙමු.

ස්වල්ප වේලාවකින් ප්‍රදර්ශනය ආරම්භ විය. පේළියේ මුලට ම සිටි පාසලේ සිසු කණ්ඩායමට අංක 01 කුටියට ඇතුළු වීමට අවසර ලැබුණි. සෙසු කණ්ඩායම්වලට පේළි අනුපිළිවෙළින් අනෙක් කුටි කරා යාමට සංවිධායක මණ්ඩලයෙන් උපදෙස් ලැබුණි.

අපේ පන්තිය භාර ගුරුවරයා අප සමඟ ද, අප පාසලෙන් ගිය අනෙක් ගුරුවරු තමතමන්ගේ පන්තිවල සිසුන් සමඟ ද ප්‍රදර්ශනය බැලීමට ගියහ.

මෙහි පොත්පත් හා සඟරා ප්‍රදර්ශනය සඳහා ද කුටියක් වෙන් කර තිබුණි. එම කුටිය නැරඹීමට අප තුළ වූයේ ඉමහත් ආශාවකි. මා කැමති ම ලේඛකයා වූයේ මාර්ටින් වික්‍රමසිංහ මහතා ය. "ලෝක පූජිත ලේඛකයෝ" නම් පොත ද එහි දී අපට දැකගත හැකි විය.

අපේ රට ඇතුළු ආසියාතික රටවල් පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන කුටිය අප කාගේත් සිත් ගත් ප්‍රදර්ශන කුටිය විය.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

සම්පාදනය - උපුල් දිසානායක
දු.ක. 071 8676537 / 0775704052